දූරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑ,, )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) **NPTCCD/M&E/Death Review/2025/16**

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )
Date ) .03.2025

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு

**Ministry of Health & Mass Media**

---

පොදු චක්‍රලේඛ අංක ....................................

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ජාතික රෝහල - කොළඹ සහ මහනුවර,

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

සියළුම ශික්ෂණ මහ රෝහල්, පළාත් මහා රෝහල්/ දිස්ත්‍රික් මහා රෝහල් අධ්‍යක්ෂවරුන්,

සියළුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

සියළුම මුලික රෝහල් වෛද්‍ය අධිකාරීවරුන්,

සියළුම රෝහල් භාර වෛද්‍ය නිලධාරීන්,

සියළුම දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන නිලධාරීන්,

## <u>රෝහල් මට්ටමින් ක්ෂය රෝග මරණ විමර්ශන සිදුකිරීම</u>

ශ්‍රී ලංකාව 2035 වසර වන විට ක්ෂය රෝගය තුරන් කිරීමේ ඉලක්ක කරා ළගා වීමට අරමුණු කරයි. ක්ෂය රෝගය නිසා සිදුවන මරණ සංඛ්‍යාව 2015 වසරේ වාර්තාගත ක්ෂය රෝග මරණ (648) ප්‍රමාණයට වඩා 95% කින් අඩු කිරීම (32), මෙහිදී සාක්ෂාත් කර ගත යුතු ප්‍රධාන ඉලක්කයන්ගෙන් එකකි.

පසුගිය වසර 10 තුළ ශ්‍රී ලංකාවෙහි ක්ෂය රෝග ප්‍රතිකාර සාර්ථකත්වය ගෝලීය ඉලක්කය වන 90% වඩා අඩු මට්ටමක පවතී. මෑත වසර වල අඩු ප්‍රතිකාර සාර්ථකත්වය සඳහා ප්‍රධාන හේතුව වන්නේ ඉහළ ක්ෂය රෝග මරණ ප්‍රතිශතයක් පැවතීමයි. 2024 වසරේදී ක්ෂය රෝග මරණ 780 ක් ලෙස වාර්තා වී ඇති අතර එය මුළු රෝගීන් (9180) සංඛ්‍යාවෙන් 7.9% කි. කෙසේ වුවත් මෙම මරණ වලින් සමහර මරණ වළක්වා ගත හැකි බව නිරීක්ෂණය වී ඇත.

එබැවින්, දැනට ක්ෂේත්‍ර මට්ටමින් පමණක් ක්‍රියාත්මක වන ක්ෂය රෝග මරණ විමර්ශන, රෝහල් වල මිය ගිය රෝගීන් සඳහා රෝහල් මට්ටමින් ද සිදු කිරීමට තීරණය කර ඇත. ක්ෂය රෝගීන්ගේ සායනික කළමනාකරණයේදී පවතින ප්‍රමාදයන් හා අඩුපාඩු හඳුනාගෙන එය නිවැරදි කිරීමේ අරමුණින් සෞඛ්‍ය ආයතනවලදී (රෝහල්වල) මිය ගිය සියළුම ක්ෂය රෝගීන් සඳහා මෙසේ මරණ විමර්ශනය කළ යුතු වේ.

එබැවින්, මේ සම්බන්ධව පහත ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ රෝහල් ප්‍රධානීන් වෙත දන්වා සිටිමි.

1. අදාළ රෝහල් වල ආයතනික ක්ෂය රෝග මරණ විමර්ශන කටයුතු සම්බන්ධීකරණය සඳහා වගකිවයුතු නිලධාරියෙකු පත්කිරීම.
2. සියළුම ක්ෂය රෝග මරණ අදාළ දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන වෛද්‍ය නිලධාරීයාට ආයතනික ක්ෂය රෝග මරණ විමර්ශන සැලසුම් කර ගැනීම පහසු වන සේ හැකි ඉක්මනින් දැනුම් දීම (එක් එක් දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන නිලධාරී සම්බන්ධතා තොරතුරු අමුණා ඇත).
3. ලියාපදිංචි වී නොමැති සියලුම ක්ෂයරෝග මරණ අදාළ දිස්ත්‍රික් ළය සායනෙහි දිස්ත්‍රික් ක්ෂය රෝග ලේඛනයේ (TB 03 ) ලියාපදිංචි කිරීම.
4. පශ්චාත් මරණ පරීක්ෂණයකදී සක්‍රිය ක්ෂය රෝගය තිබෙන බවට තහවුරු වුවහොත්, අදාළ දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන නිලධාරීන් (දුරකථනය හරහා) දැනුවත් කිරීම මගින් මරණ ලියාපදිංචිය, මරණ විමර්ශනය සහ ආශ්‍රිතයන් පරීක්ෂා කිරීම පහසු කිරීම.
5. මිය ගිය දින සිට මාසයක් ඇතුළත සෞඛ්‍ය ආයතන වල සිදු වූ සියළුම ක්ෂය රෝග මරණ විමර්ශනය කිරීමට පහසුකම් සැළසීම.
6. මියගිය පුද්ගලයන්ගේ ඇඳ ඉහපත් සංරක්ෂණය කර අදාළ වාර්තා වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය නිලධාරීන් හට අවසර ලබාදීම.
7. ආයතනික මට්ටමින් මරණ විමර්ශනය පැවැත්වීම සඳහා ශ්වසන රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් හා මරණය සිදුවූ ඒකකය/රෝගියා රෝහල් ගතව සිටින කාලය තුළ සායනික කළමනාකරණය සිදු කළ ඒකකය භාර විශේෂඥ වෛද්‍යවරුන් ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම.
8. ක්ෂය රෝගයට ප්‍රතිකාර කිරීමේදී හෝ ක්ෂය රෝගයට ප්‍රතිකාර ආරම්භ කිරීමට පෙර සිදුවන සියළුම මරණ ක්ෂය රෝග මරණ ලෙස සැලකේ.කෙසේ වෙතත් මරණ විමර්ශනය අතරතුර මරණයට තුඩු දුන් හේතුව තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී එය "ක්ෂය රෝගය නිස සිදු වූ මරණයක් ", "ක්ෂය රෝගය නිසා සිදු නොවූ මරණයක්" හෝ "හේතුව අවිනිශ්චිත මරණයක්" වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. මරණයට තුඩු දුන් හේතුව පිළිබඳ නිගමනයකට පැමිණීම විමර්ශන කණ්ඩායමේ කාර්යභාරයක් වන අතර, මරණයට තුඩු දුන් නමුත් ඉදිරියේදී වලක්වා ගත හැකි හේතු ද කණ්ඩායම විසින් විශ්ලේෂණය කළ යුතුය.
9. සියළුම දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන නිලධාරීන් විසින් ක්ෂය රෝග මරණ විමර්ශන පෝරමය (TB – 17 අමුණා ඇත) සම්පූර්ණ කළ යුතු අතර, ඒ සඳහා සහභාගී වූ වගකිය යුතු වෛද්‍ය නිලධාරීන්ගේ / විශේෂඥ වෛද්‍ය නිලධාරීන්ගේ අත්සන ලබා ගත යුතුය.
10. නිසි පරිදි සම්පූර්ණ කරන ලද TB 17 පෝරමය සම්පූර්ණ කළ වහාම ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන වෙත එවීමට සියළුම දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන නිලධාරීන් විසින් කටයුතු කළ යුතුය.
11. ඉදිරි සමාලෝචන කටයුතු සඳහා ක්ෂය රෝග මරණ විමර්ශන පත්‍ර වල පිටපතක් තබා ගැනීම සියළුම දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන නිලධාරීන් විසින් සිදු කළ යුතුය.

වැඩි විස්තර සඳහා කරුණාකර ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන අමතන්න. ( දුරකථන අංකය :- 011 – 2368386 )

.............................................

වෛද්‍ය අසේල ගුණවර්ධන,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල

385, සුවසිරිපාය, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
385,வணக்கத்துக்குரிய பத்தேக மவிமலவங்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.